දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දකුණු පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2016 (2017)

1.0 අංක 246 හා 2014.05.21 දිනැති දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද දකුණු පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරීන්ට අදාළ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි විධිවිධානයන්ට අනුකූලව සහ 2016.12.02 දිනැතිව සිදුකරන ලද සංශෝධනයන්ට අනුකූලව, දකුණු පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් මෙම කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2017.01.23 දින වන අතර, මෙම විභාගය 2017 මාර්තු මස පැවැත්වේ.

2.0 දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්, දිස්ත්‍රික් ජනගහන අනුපාතය අනුව බඳවා ගැනීම සිදු කෙරේ. බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේදී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විවෘත තරඟ විභාගයෙන් සමත් වන අයදුම්කරුවන්ගෙන් බඳවා ගන්නා අතර බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

3.0 සුදුසුකම් :

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. මනා ශාරීරික සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නයේ වසර 05 ක කාලය තුළ දකුණු පළාත් සභා බල ප්‍රදේශයේ අයදුම් කරනු ලබන දිස්ත්‍රික්කය තුළ අනුගාමී වසර 03 ක කාලයක් අයදුම්කරුගේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය. පදිංචිය සනාථ කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය.

(අ) මැතිවරණ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඡන්දහිමි නාම ලේඛන උධෘතය

සහ

(ආ) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය.

IV. මෙම අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

4.0 වයස

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

5.0 වැටුප් ක්‍රමය

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, දකුණු පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ MN 4-2016 වන අතර මාසික වැටුප් පරිමාණය 31,490/- - 445x10-660x11-730x10-750x5-54,250/- වේ. එම චක්‍ර ලේඛයේ උපලේඛන II අනුව 2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා අදාළ වනුයේ රු. 21,725/- මූලික වැටුපක් හා රු. 6,533/- ක ගැලපුම් දීමනාවකි.

6.0 සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි

(අ) මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ වලට ඔබ යටත් විය යුතුවේ.

(ආ) බඳවා ගනු ලබන අයදුම්කරුවන් වසර තුනක පරිවාස කාලයකට යටත් වන්නේය. නිලධාරියා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වීම හා නිලධාරියාගේ වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සෑහීමකට පත්වන්නේ නම් වසර තුන අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබේ.

7.0 මාධ්‍යය

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යය තුනෙන්ම පැවැත්වේ. ඔබ කැමති භාෂා මාධ්‍යයකින් ඉල්ලුම් කළ හැකිය.

8.0 විභාග ක්‍රමය

මෙම විභාගය ප්‍රශ්නපත්‍ර තුනකින් සමන්විත වේ.

ප්‍රශ්න පත්‍ර අංකය	ප්‍රශ්න පත්‍රයේ නම	කාලය	ලකුණු	සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය
01	සාමාන්‍ය දැනුම	පැය 01 යි	100	40%
02	අභියෝගතාවය	පැය 01 යි	100	40%
03	ව්‍යාපෘති සැලසුම්කරණය	පැය 01 යි	100	40%

විභාගය සඳහා විෂය නිර්දේශය :

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
සාමාන්‍ය දැනුම	ජාතික හා ජාත්‍යන්තර සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අංශ පිළිබඳ දැනුම
අභියෝගතාවය	සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්න
ව්‍යාපෘති සැලසුම්කරණය	ව්‍යාපෘතියක් යන්න නිර්වචනය කිරීම, ව්‍යාපෘති කළමනාකරණය, ව්‍යාපෘති චක්‍රය, ව්‍යාපෘති පිළියෙල කිරීම හා විග්‍රහ කිරීම, ව්‍යාපෘති ඇගයුම, ව්‍යාපෘති සංවිධානය, ඡායා මිල ගණන් යොදාගැනීම

9.0 විභාගය පැවැත්වීමට යෝජිත නගර

විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට යෝජිත නගරයන් පහත පරිදිය. යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වූ විට විභාගය එකී නගරයට ආසන්නතම නගරයේදී පවත්වනු ඇත. අයදුම්කරුවන් නගරය ලෙස සඳහන් කළ යුත්තේ අයදුම්කරුගේ ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයේ පහත සඳහන් නගරයක් පමණි.

දිස්ත්‍රික්කය	විභාග නගරය	නගර අංකය
ගාල්ල	ගාල්ල	07
මාතර	මාතර	08
හම්බන්තොට	තංගල්ල	09

10.0 අයදුම්පත්‍ර

(අ) මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ 4 (සෙ. මී. 21 x 30) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කළ යුතුය. අංක 01 සිට 03 දක්වා ශීර්ෂ පළමු වන පිටුවට ද, අංක 04 සිට 08 දක්වා ශීර්ෂ දෙවන පිටුවට ද, අංක 09 සිට 12 දක්වා ශීර්ෂ තෙවන පිටුවට ද ඇතුළත් වන පරිදි සකස් කර ඊට අදාළ තොරතුරු පැහැදිලිව ඇතුළත් කළ යුතුය. අයදුම්පත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.sp.gov.lk මගින්ද ලබා ගත හැකිය.

(ආ) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.01.23 දිනට පෙර, "**ලේකම්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 6 වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, ගාල්ල**" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**දකුණු පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය – 2016 (2017) – ____________ දිස්ත්‍රික්කය**" (ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය දක්වන්න) යනුවෙන් සඳහන් කළ යුතුය. කිසිදු සහතික පත්‍රයක් / ඡායා පිටපතක්, අයදුම්පත සමඟ අමුණා නොඑවිය යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ඇ) අයදුම්පත් සකස් කළ යුත්තේ තම විභාගයට පෙනී සිටීමට කැමති භාෂා මාධ්‍යයෙනි. භාෂා මාධ්‍යය පසුව වෙනස් කළ නොහැකිය.

(ඈ) ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති හා අයදුම්පත් කැඳවන අවසාන දිනට පසුව මුදල් ගෙවූ කුවිතාන්සි ඇතුළත් අයදුම්පත්, මුදල් ගෙවූ කුවිතාන්සි අලවා නොමැති අයදුම්පත් හා ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව මෙම කොමිෂන් සභාව විසින් වගකියනු නොලැබේ. අයදුම්පත් ලද බව හෝ ප්‍රතික්ෂේප කළ බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ.

(ඉ) අයදුම්පතේ සඳහන් අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

11.0 විභාග ගාස්තු

(අ) මෙම විභාගය සඳහා අයදුම්කරන සෑම අයදුම්කරුවෙකු විසින්ම විභාග ගාස්තු ලෙස රු. 500/- ක මුදලක් දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2003.02.13 දරන අය ශීර්ෂයට බැර වන පරිදි දකුණු පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලද ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ ඇලවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම දැන්වීමේ සඳහන් නොවන අයුරින් මුදල් ගෙවා ලබාගන්නා ලද ලදුපත් සහිත අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, කුමන හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ මාරු කිරීමක් සිදුකරනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතුය. තවද, අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම ප්‍රශ්නපත්‍රයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(I) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(II) වලංගු විදේශ ගමන් බලපත්‍රය

විභාගය පැවැත්වීමට නියමිත දිනට දින 07 කට කලින් විභාග ප්‍රවේශ පත්‍ර නොලද අපේක්ෂකයන් පහත සඳහන් විස්තර ඇතිව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලිඛිතව හෝ දුරකථන අංක 091-2234309 ඔස්සේ දන්විය යුතුය.

I. විභාගයේ නම

II. අයදුම්කරුගේ සම්පූර්ණ නම

III. සම්පූර්ණ ලිපිනය

IV. අයදුම්පත් තැපැල් කළ කාර්යාලය, ලියාපදිංචි කළ අංකය හා දිනය

අයදුම්පත්‍ර නොලැබී හෝ අස්ථාන ගතවීමක් හේතුවෙන් ප්‍රවේශ පත්‍ර නොලැබී ගියහොත් ප්‍රවේශපත්‍රය ලබා ගැනීමට අයදුම්පත්‍රයේ පිටපතක් සමඟ ලියාපදිංචි කළ කුවිතාන්සියේ පිටපතක් රැගෙන කොමිෂන් සභා කාර්යාලයට අයදුම්කරු හෝ අයදුම්කාරිය විසින්ම පැමිණිය යුතුය.

12.0 තෝරා ගැනීමේ ක්‍රමය

(අ) මෙම තනතුරු සඳහා ඉහත 08 ඡේදයේ දක්වා ඇති පරීක්ෂණ වලින් දක්වන ලද කුසලතාවය හා රා.ප.ච. 15/90 හි සඳහන් විධිවිධාන හා දිස්ත්‍රික්ක ජනගහන අනුපාතයට අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයකින් පසුව පුද්ගලයන් තෝරාගනු ලැබේ. (පත්වීම් ප්‍රදානයේදී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්වීම් දිය යුතු අවසාන ප්‍රමුඛතා මට්ටමේ සම ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිපදෙනෙකු සිටින අවස්ථාවකදී සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අධ්‍යාපන සුදුසුකම් අනුව ඉහළම සුදුසුකම් ඇති අයදුම්කරුවන් අනුපිළිවෙලින් තෝරා ගැනේ) යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු ඇබෑර්තු සංඛ්‍යාව සඳහා තරඟ කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරනු ලැබූ අයදුම්කරුවන් පමණි.

(ආ) පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3% ක් ආබාධ සහිත අයදුම්කරුවන් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේදී සුදුසුකම් ලබන ආබාධ සහිත පුද්ගලයන් අතුරින් ඉහළම ලකුණු ලබාගත් 3% ක ප්‍රතිශතයක් පමණක් පත්වීම් ලබා දීම සඳහා තෝරා ගැනෙනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයන්ගේ ලකුණු මට්ටම යටත් පිරිසෙයින් 50% ක් වත් විය යුතුය. පත්වීමක් සඳහා තෝරා ගනු ලැබූ අපේක්ෂකයකු විශේෂඥ වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන අතර, විශේෂඥ වෛද්‍ය වාර්තාවකින් තම ආබාධ සහිත තත්වය හා එය අදාළ තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා බාධාවක් නොවන බවට තහවුරු කළ යුතුය. මේ අනුව, අයදුම්පත්‍රයේ 06 වන ශීර්ෂය සම්පූර්ණ කළ යුතු අතර, ඔබගේ ආබාධිත තත්ත්වය සනාථ කළ හැකි ලිපි ඇමිණිය යුතුය.

(ඇ) සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව සෑම අයදුම්කරුවෙකුටම විභාගයට ඉදිරිපත්වීම සඳහා අවස්ථාව ලබාදෙනු ලැබේ. විභාග ප්‍රතිඵල මත කුසලතාවය අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, අයදුම්පත් කැඳවන අවසාන දිනට, නිවේදනය ප්‍රකාර සුදුසුකම් ලබා නොමැති අයදුම්කරුවන් පත්වීමක් ලැබීමට සුදුසුකම් නොලබන්නේය.

13.0 සාවද්‍ය තොරතුරු සැපයීම

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගය පැවැත්වීමට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගය පැවැත්වීමෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද, අපේක්ෂකයකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු / ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

මෙම නිවේදනයේ සඳහන් නොවන වෙනත් ඕනෑම කරුණක් පිළිබඳව අවසාන තීරණයක් ගැනීමේ බලය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේය.

යූ.ජී. විදුර කාරියවසම්
ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2016 දෙසැම්බර් මස 19 දින,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
6 වන මහල,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
ගාල්ල.

(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස් කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු සහිත අයදුම්පත්‍ර කෙරෙහි කිසිදු වගකීමක් දරනු නොලැබේ)

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා ☐
ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය ☐

දකුණු පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2016 (2017)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4) ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

විභාග නගරය ☐ නගර අංකය ☐
(විභාග නිවේදනයේ 09 වන ඡේදය බලන්න)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ....

(උදා : GUNAWARDHANA H.M.S.K.)

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ....

(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) : ....

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ....

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්) : ....

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ....

3.0 3.1 ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී - 1 ☐
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 2017.01.23 දිනට වයස අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

3.4 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ....

3.5 දුරකතන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

4.0 අධ්‍යාපන සුදුසුකම් :

4.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර

	විභාග වර්ෂය			විභාග අංකය	
	විෂයය	ශ්‍රේණිය		විෂයය	ශ්‍රේණිය
1			6		
2			7		
3			8		
4			9		
5			10		

4.2 අ.පො.ස. (උසස් පෙළ) විභාගය පිළිබඳ විස්තර :

විභාග වර්ෂය		විභාග අංකය	
විෂයය	සාමාර්ථය	විෂයය	සාමාර්ථය
1		3	
2		4	

4.3 උපාධිය පිළිබඳ විස්තර / ලබා ඇති වෘත්තීය සුදුසුකම් :

උපාධිය/ඩිප්ලෝමා / වෘත්තීය සහතිකයේ නම	වලංගු වන දිනය	විෂයයන්	සාමාර්ථය	විශ්ව විද්‍යාලය / නිකුත් කළ ආයතනයේ නම

5.0 වෙනත් සුදුසුකම් :

6.0 ඔබ ආබාධිත පුද්ගලයෙකු නම් ආබාධිත තත්වය සඳහන් කරන්න
....
(ඒ බැව් සනාථ කරන ලිපි අමුණන්න)

7.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? (අදාළ කොටුවේ ✓ ලකුණු යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

ඔව් ☐ නැත ☐
....

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
8.1 විභාග ගාස්තු ගෙවූ කාර්යාලය : ....
8.2 ලදුපත් අංකය හා දිනය : ....
8.3 ගෙවූ මුදල : ....

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
(ලදුපතේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගන්න)

9.0 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වුවෙකු නම්
9.1 දෙපාර්තමේන්තුව / ආයතනය : ....
9.2 දැනට දරන තනතුර : ....
9.3 පත්වීම් දිනය : .... දින සිට .... දක්වා
9.4 සේවා කාලය : අවු ....
9.5 ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන වග :
(සේවය ස්ථිර කිරීමේ ලිපියේ පිටපතක් අමුණන්න)

10.0 **අයදුම්කරුගේ ප්‍රකාශය :**

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල මාගේ දැනීමේ හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බවත්, විභාග ගාස්තුව ගෙවූ .... ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක .... හා .... දින දරන ලදුපත මෙහි අලවා ඇති බවත්, මෙම තනතුරට මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසු හෝ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම පිළිගනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

දිනය : ....
අයදුම්කරුගේ අත්සන

11.0 **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .... මිය / මයා / මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ... වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

දිනය : ....
(සහතික කරන්නාගේ අත්සන)

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :
තනතුර :
ලිපිනය : (නිල මුද්‍රාව තබන්න)

(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් තොරතුරු දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතුය)

12.0 **ආයතන ප්‍රධානියාගේ සහතිකය / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .... මයා / මිය / මෙනවිය .... කාර්යාලයේ / ආයතනයේ .... දින සිට .... තනතුරක සේවය කරන බවද, ඔහුගේ / ඇයගේ සේවය සතුටුදායක වන බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිබවද / කළ නොහැකි බවද ඔහු / ඇය මෙතෙක් මොනයම් ආකාරයක හෝ විනයානුකූල ක්‍රියාමාර්ගයකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බවද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද, සහතික කරමි.

දිනය : ....
ආයතන ප්‍රධානියා / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

ආයතන ප්‍රධානියා / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :
තනතුර :
(නිල මුද්‍රාව තබන්න)